සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ව්‍යාපාර අධ්‍යයනය - I

13 ශ්‍රේණිය | **කාලය පැය 02 යි.**

උපදෙස්:-

- ප්‍රශ්න අංක 01 සිට 30 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුරේ අංකය තෝරා තිත් ඉරි මත ලියන්න.
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.

---

(01) ''මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම උදෙසා භාණ්ඩ හා සේවා සැපයීමට අදාළ නිෂ්පාදනය, බෙදහැරීම හා විකිණීම යනාදී ඕනෑම කාර්යයක් ව්‍යාපාර වේ. මුල් අවස්ථාවේදී සරලව පැවති ව්‍යාපාර කටයුතු අද වන විට සංකීර්ණ තත්ත්වයට පත්ව ඇත. එසේම ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා සංවිධාන ක්‍රම රාශියක් ද බිහි වී ඇත.

ව්‍යාපාර ආරම්භ වීමට බලපෑ මූලික සාධක වූයේ,

(1) හුවමාරුව හා ගනුදෙනුය.
(2) අවශ්‍යතා හා වුවමනාය.
(3) භාණ්ඩ හා සේවාය.
(4) ඉල්ලුම හා සැපයුමය.
(5) නිෂ්පාදනය හා බෙදාහැරීමය. (......)

(02) සාර්ථක ව්‍යාපාරිකයකු වීමට ව්‍යාපාර පරිසරය හොඳින් අධ්‍යයනය කළ යුතුවේ. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර වශයෙන් බෙදා දැක්විය හැකිය. බාහිර පරිසරයේ කොටස් කිහිපයක් A වගුවේ හා අභ්‍යන්තර පරිසර කොටසෙහි අන්තර්ගත සාධක B වගුවේ දැක්වේ.

බලවේග A	සාධක B
(1) දේශපාලන හා නෛතික	a - නව ශිල්ප ක්‍රම හඳුන්වා දීම
(2) ආර්ථික හා ප්‍රජා	b - නීති රීති පැනවීම
(3) ස්වාභාවික හා භූගෝලීය	c - ඇදහිලි හා විශ්වාස
(4) විද්‍යාත්මක හා තාක්ෂණ	d - දේශගුණික තත්ත්වය
(5) සමාජ හා සංස්කෘතික	e - ජනවාර්ගික සංයුතිය

(......)

A වගුවේ පරිසරයන්ට අදාළව B වගුවේ සාධක නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) 1b, 2e, 3d, 4a, 5b
(2) 1e, 2c, 3b, 4d, 5a
(3) 1c, 2d, 3e, 4a, 5b
(4) 1e, 2b, 3c, 4d, 5a
(5) 1d, 2e, 3b, 4a, 5c (......)

(03) ව්‍යාපාර විකාශනයේ අදියර අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) මුදල් භාවිතය, කාර්මික විප්ලවය, භාණ්ඩ හුවමාරුව, තොරතුරු තාක්ෂණය.
(2) තොරතුරු තාක්ෂණය, කාර්මික විප්ලවය, මුදල් භාවිතය, භාණ්ඩ හුවමාරුව.
(3) කාර්මික විප්ලවය, භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, තොරතුරු තාක්ෂණය.
(4) කාර්මික විප්ලවය, භාණ්ඩ හුවමාරුව, මුදල් භාවිතය, තොරතුරු තාක්ෂණය.
(5) භාණ්ඩ හුවමාරුව, කාර්මික විප්ලවය, මුදල් භාවිතය, තොරතුරු තාක්ෂණය. (......)

(04) A (පදනම්) | B (සාධක)

A (පදනම්)	B (සාධක)
1. පරිසරය විශ්ලේෂණය කිරීම	a - ව්‍යාපාරය ආරම්භ කිරීම
2. අවස්ථා සපුරාලීම	b - සංවිධානය කිරීම
3. සම්පත් ඒකරාශී කිරීම	c - අවස්ථා හඳුනාගැනීම

(1) 1c, 2a, 3b (2) 1c, 2b, 3a (3) 1b, 2c, 3a (4) 1b, 2a, 3c (5) 1a, 2b, 3c (......)

(05) වෙළෙඳුන් විසින් සිදු කරන ලද විෂමාචාර කිහිපයක් සහ ඒ සම්බන්ධව නෛතික විධි විධාන දක්වෙන පනත් කිහිපයක් පහත වගුවේ දැක්වේ.

තීරුව A	තීරුව B
1. ග්‍රෑම් 450 ට අඩු පාන් අලෙවිය	A - විලවුන් උපකරණ හා ඖෂධ පනත
2. කල් ඉකුත් වූ අයිස්ක්‍රීම් අලෙවිය	B - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත
3. මෙලමයින් අඩංගු කිරිපිටි අලෙවිය	C - කිරුම් මිනුම් ඒකක ප්‍රමිති හා සේවා පනත
4. නොමඟ යවන සුළු ප්‍රචාරණය	D - ආහාර පනත
	D - ජනමාධ්‍ය පනත

(1) CAEB (2) BADE (3) CADB (4) DABC (5) ADBC (......)

(06) 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි සඳහන් කෙරෙන ප්‍රධාන සමාගම් වර්ග තුන අයත් කාණ්ඩය මින් කුමක් ද?

(1) සීමාසහිත පෞද්ගලික සමාගම් / නිල ලැයිස්තුගත සමාගම් / ඇපයෙන් සීමිත සමාගම්
(2) සීමාසහිත සමාගම් / අක්වෙරළ සමාගම් / අනේවාසික සමාගම්
(3) ඇපයෙන් සීමිත සමාගම් / සීමාරහිත සමාගම් / අනේවාසික සමාගම්
(4) සීමාසහිත පොදු සමාගම් / සීමාසහිත පෞද්ගලික සමාගම් / ඇපයෙන් සීමිත සමාගම්
(5) සීමාරහිත සමාගම් / සීමාසහිත සමාගම් / ඇපයෙන් සීමිත සමාගම් (......)

(07) විද්‍යුත් බැංකු කරණය යටතට අයත් ප්‍රධාන අංශ නිවැරදිව දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) ස්වයංක්‍රීය බැංකු යන්ත්‍ර / විකුණුම් අවස්ථාවේදීම ගෙවීම් පද්ධතිය / ගෘහස්ත බැංකුකරණය
(2) සුරක්ෂිත පහසුකම් / අන්තර් බැංකුකරණය / ණයපත් සේවාව
(3) හරපත් සේවාව / සෘජු හර පැවරුම් / ගෘහස්ථ බැංකු කරණය
(4) ස්වයංක්‍රීය බැංකු යන්ත්‍ර / ටෙලිබැන්කින් / ඒකීය බැංකු කරණය
(5) දුරකථන බැංකු පහසුකම් / හර හා බැර පැවරුම් / කේන්ද්‍රගත බැංකු ජාල (......)

(08) පහත වගුවේ X තීරුවේ ප්‍රධාන මුල්‍ය ආයතන වර්ග ද, Y තීරුවේ මුල්‍යායතන කිහිපයක නම් ද දැක්වේ.

X	Y
A. බලපත්‍රලාභී වාණිජ බැංකු	1. කොමෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්
B. බලපත්‍රලාභී විශේෂිත බැංකු	2. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
C. ලියාපදිංචි මුල්‍ය සමාගම්	3. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
	4. ලංකා බැංකුව
	5. රුහුණු සංවර්ධන බැංකුව
	6. කොමර්ෂල් ක්‍රෙඩිට් ලිමිටඩ්
	7. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව
	8. සෙලින්කෝ සේවින්ස් බැන්ක් ලිමිටඩ්
	9. එල්.බී. ෆිනෑන්ස් ලිමිටඩ්

Y තීරුවේ මුල්‍ය ආයතන X තීරුවේ වර්ගවලට අනුව ගැලපූවිට ලැබෙන නිවැරදි කාණ්ඩය කුමක් ද?

(1) A - 1,2,5 / B - 3,4,6 / C - 7,8,4
(2) A - 2,3,4 / B - 1,5,8 / C - 6,7,9
(3) A - 5,6,7 / B - 1,3,4 / C - 2,8,9
(4) A - 2,3,4 / B - 1,5,6 / C - 7,8,9
(5) A - 1,4,7 / B - 3,5,8 / C - 2,6,9 (......)

(09) පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක සමාජ වගකීම් කිහිපයකි.

A - විනිවිදභාවය B - සමානව සැලකීම C - පිරිසිදු පරිසරය

D - මනා වැඩ පරිසරය E - වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍යය සහතික කිරීම

F - ගුණාත්මක භාණ්ඩ

මේවා අතරින් සේවක පාර්ශවයට අදාළ ව්‍යාපාරික සමාජ වගකීම් වන්නේ,

(1) ABD (2) BDE (3) ABE (4) BDF (5) CDF (......)

(10) පහත දැක්වෙන්නේ ප්‍රමිති වර්ග කිහිපයක් පිළිබඳ විස්තරයකි.

A - වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති සහතිකකරණයකි.

B - ආහාර ආරක්ෂණ කළමනාකරණ පද්ධති සහතිකකරණයකි.

C - පරිසර කළමනාකරණ පද්ධති සඳහා වූ සහතිකකරණයකි.

D - යහපත් නිෂ්පාදන පිළිවෙත් සඳහා වූ සහතිකකරණයකි.

ඉහත සඳහන් විස්තරයන්ට අනුව ISO 22000 සහ GMP සහතිකකරණයට අදාළ විස්තර නිවැරදිව ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) B හා D (2) A හා C (3) B හා C (4) A හා B (5) A හා D (......)

(11) විවිධ වර්ගයේ භාණ්ඩ සඳහා එකම ගොඩනැගිල්ලක වෙන වෙනම අංශ සංවිධානය කරමින් ක්‍රියාත්මක වන විශාල සිල්ලර වෙළඳ සැල් හැඳින්වෙනුයේ,

(1) බැඳි වෙළෙඳ සැල් ලෙසය. (2) නානාංශ වෙළෙඳ සැල් ලෙසය.

(3) ආංශික වෙළෙඳ සැල් ලෙසය. (4) විශේෂ වෙළෙඳ සැල් ලෙසය.

(5) වට්ටම් වෙළෙඳ සැල් ලෙසය. (......)

(12) කේවලස්වාමි ව්‍යාපාරයක සාර්ථකත්වය මැනීම සඳහා භාවිතා කළ නොහැකි මිණුම් දණ්ඩක් වන්නේ,

(1) අයිතිකරුගේ ව්‍යවසායකත්ව කුසලතා වේ. (2) අයිතිකරුගේ අධ්‍යාපන මට්ටම් වේ.

(3) නිෂ්පාදනයේ හෝ සේවාවේ ගුණත්වය වේ. (4) මූල්‍ය කාර්යසාධනය වේ.

(5) සේවක සංඛ්‍යා වේ. (......)

(13) පහත සඳහන් වන්නේ ව්‍යවසායකත්වය පිළිබඳ අදහස් කිහිපයකි.

1. නව නිපැයුම්හි යෙදෙන සමාගම් සේවකයා.
2. ගැටලුවක් හඳුනාගෙන එය අවස්ථාවක් බවට පත් කර එය විසඳීමට සුදුසු අදහසක් නිර්මාණය කිරීම.
3. ගැටලුවක් හඳුනාගෙන එයට විසඳුමක් ලෙස අදහසක් ඇති කරගෙන එය අවස්ථාවක් බවට පත් කිරීම.
4. ලාභය හෝ ධනය ඉපයීම අරමුණු කර නොගෙන සාමාජයීය වටිනාකම් හා සාරධර්ම පෝෂණය කිරීමේ අරමුණින් නව්‍යතා සම්පාදනය කිරීම.

ඉහත එක් එක් ප්‍රකාශයෙන් ගම්‍යවන ව්‍යවසායකත්ව සංකල්පය පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) අභ්‍යන්තර ව්‍යවසායකත්වය / වෙළෙඳ පොළෙන් ඇඳුණු ව්‍යවසායකත්වය / නිෂ්පාදිතය මඟින් තල්ලු වන ව්‍යවසායකත්වය / සාමාජීය ව්‍යවසායකත්වය.

(2) ව්‍යවසායකත්වය / නිෂ්පාදිතය මඟින් තල්ලු වන ව්‍යවසායකත්වය / වෙළෙඳ පොළෙන් ඇඳුණු ව්‍යවසායකත්වය / සාමාජීය ව්‍යවසායකත්වය.

(3) අභ්‍යන්තර ව්‍යවසායකත්වය / නිෂ්පාදිතය මඟින් තල්ලු වන ව්‍යවසායකත්වය / වෙළෙඳ පොළෙන් ඇඳුණු ව්‍යවසායකත්වය / සාමාජීය ව්‍යවසායකත්වය.

(4) අභ්‍යන්තර ව්‍යවසායකත්වය / වෙළෙඳ පොළෙන් ඇඳුණු ව්‍යවසායකත්වය / නිෂ්පාදිතය මඟින් තල්ලු වන ව්‍යවසායකත්වය / පරාර්ථකාමී ව්‍යවසායකත්වය.

(5) ව්‍යවසායකත්වය / වෙළෙඳ පොළෙන් ඇඳුණු ව්‍යවසායකත්වය / නිෂ්පාදිතය මඟින් තල්ලු වන ව්‍යවසායකත්වය / කාන්තා ව්‍යවසායකත්වය

(......)

The National Learning Portal for The General Education

(14) X තීරුව | Y තීරුව

X තීරුව	Y තීරුව
1. විද්‍යුත් මුදල්	A - රන්කාසි
2. ආසන්න මුදල්	B - භාණ්ඩාරගාර බිල්පත්
3. නියෝග මුදල්	C - ශත 50
4. ප්‍රාමාණික මුදල්	D - ණයපත්

(1) CADB (2) DCAB (3) ACBD (4) DBCA (5) ABCD (......)

(15) හෙන්රි මින්ස්බර්ග්ට (Henry Mintzberg) අනුව කළමනාකරුවන්ගේ භූමිකා පහත දැක්වේ.

1. නාම මාත්‍ර විධායක
2. සම්පත් බෙදාහරින්නා
3. ප්‍රකාශකයා
4. නායකයා
5. කතිකා කරන්නා
6. ආරවුල් සමනය කරන්නා
7. තොරතුරු බෙදාහරින්නා
8. සහයෝගීතාව ගොඩනගන්නා
9. නියාමකයා
10. ව්‍යවසායකයා

ඉහත භූමිකා අතුරින් අන්තර් පුද්ගල භූමිකා (INTERPERSONAL ROLES) නිවැරදිව දැක්වෙන්නේ,

(1) සහයෝගීතාව ගොඩනගන්නා / නියාමකයා / කතිකා කරන්නා
(2) සම්පත් බෙදාහරින්නා / ප්‍රකාශකයා / ව්‍යවසායකයා
(3) නාම මාත්‍ර විධායක / නායකයා / සහයෝගීතාව ගොඩනගන්නා
(4) නාම මාත්‍ර විධායක / කතිකා කරන්නා / සහයෝගීතාව ගොඩනගන්නා
(5) සහයෝගීතාව ගොඩනගන්නා / තොරතුරු බෙදාහරින්නා / ආරවුල් සමනය කරන්නා (......)

(16) ජනිඳු ප්‍රඩක්ට්ස් තමන්ගේ නිෂ්පාදිත ද්‍රව්‍ය පරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයාට සිදුවීමට ඉඩ තිබූ අවදානම් ආවරණය කර ගැනීමට ලබාගත යුතු රක්‍ෂණ ඔප්පු වර්ගය වන්නේ,

(1) මහජන වගකීම් රක්‍ෂණ ඔප්පුව
(2) සොරබිය රක්‍ෂණ ඔප්පුව
(3) සේවක වන්දි රක්‍ෂණ ඔප්පුව
(4) විස්තීර්ණ රක්‍ෂණ ඔප්පුව
(5) පුද්ගල හදිසි අනතුරු රක්‍ෂණ ඔප්පුව (......)

(17) එක් ප්‍රධානියෙකුට සෘජුව වාර්තා කරන යටත් නිලධාරීන් සංඛ්‍යාව හඳුන්වන්නේ,

(1) ධූරාවලිය (Hierarchy)
(2) සංවිධාන ව්‍යුහය (Organizational structure)
(3) විධානදාමය (Chain of command)
(4) පාලන අවකාශය (Span of control)
(5) සංවිධාන සටහන (Organizational chart) (......)

(18) පහත වගුවේ එක් තීරුවක නිෂ්පාදිත දක්වා ඇති අතර අනෙක් තීරුවේ නිෂ්පාදිත පිරියත දක්වා ඇත.

නිෂ්පාදිත	නිෂ්පාදිත පිරියත
A - ජෑම් බෝතල්	W - ස්ථාවර ස්ථානීය පිරියත
B - ගුවන්යානා	X - ක්‍රියාවලි පිරියත
C - ගෘහ භාණ්ඩ	Y - නිෂ්පාදිත පිරියත
D - ඇණවුම්මත ස්වර්ණාභරණ	Z - කුටි පිරියත

එක් එක් නිෂ්පාදිතය සඳහා වඩාත්ම ගැළපෙන නිෂ්පාදිත පිරියත දැක්වෙන කාණ්ඩය තෝරන්න.

(1) A - Y / B - W / C - X / D - Z
(2) A - W / B - Y / C - Z / D - X
(3) A - X / B - Z / C - Y / D - W
(4) A - Y / B - X / C - W / D - Z
(5) A - Y / B - Z / C - X / D - W (......)

(19) දේශීය භාණ්ඩ 34 ක් සඳහා SLS ලාංඡන සහතික ලබාගැනීම අනිවාර්ය කර තිබේ. එවැනි භාණ්ඩ පමණක් අන්තර්ගත කාණ්ඩය කුමක් ද?

(1) ටින්මාළු / පළතුරු කෝඩියල් / ජෑම් / දන්තාලේප / දත්බුරුසු

(2) පළතුරු කෝඩියල් / සිසිල්බීම / ජෑම් / සීනි / උකු කිරි

(3) ටින්කළ පළතුරු / සිසිල්බීම / ජෑම් / මැටි සෙවිලි උළු / වතුර බෝතල්

(4) ජෑම් / ටින්කළ පළතුරු / උකු කිරි / ඇඟ ගල්වන සබන් / අභ්‍යාස පොත්

(5) ටින් මාළු / උකු කිරි / නැවුම් පළතුරු කෝඩියල් / විදුලි බුබුලු / දන්තාලේප (......)

(20) පහත දැක්වෙන්නේ රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් වර්ග කිහිපයකි,

A - යන්ත්‍රෝපකරණ ක්ෂය වීම

B - ගායකයකුගේ කටහඬ

C - මරණය

D - වයසට යාම

E - සේවකයින් සේවයෙන් ඉවත් වීම

ඉහත සඳහන් කරුණු අතුරෙන් රක්ෂණය කළ නොහැකි අවදානම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

(21) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ ප්‍රධාන සංරචක ලෙස සැලකිය හැක්කේ,

(1) සම්බන්ධතා අලෙවිකරණය / සමෝධානික අලෙවිකරණය / අභ්‍යන්තර අලෙවිකරණය / සමාජ වගකීම් අලෙවිකරණය

(2) සම්බන්ධතා අලෙවිකරණය / ගනුදෙනුකරු අලෙවිකරණය / අභ්‍යන්තර අලෙවිකරණය / සමාජ වගකීම් අලෙවිකරණය

(3) සම්බන්ධතා අලෙවිකරණය / සමෝධානික අලෙවිකරණය / සදාචාරාත්මක අලෙවිකරණය / කාර්යඵල අලෙවිකරණය

(4) සමෝධානික අලෙවිකරණය / සාමාජීය අලෙවිකරණය / අභ්‍යන්තර අලෙවිකරණය / කාර්යඵල අලෙවිකරණය /

(5) සම්බන්ධතා අලෙවිකරණය / සමෝධානික අලෙවිකරණය / බාහිර අලෙවිකරණය / සමාජ වගකීම් අලෙවිකරණය /

(......)

(22) නිෂ්පාදන පුළුල්ව වර්ගීකරණය කිරීමේදී අයත්වන අයිතම හා ඊට අදාළ නිදසුන් කිහිපයකි.

නිෂ්පාදන	නිදසුන්
A - ඉසව්	1. පරීක්ෂණ වාර්තා
B - සංවිධාන	2. වෙළඳ ප්‍රදර්ශන
C - දේපොල	3. ක්‍රීඩා සමාජ
D - තොරතුරු	4. සාමාන්‍ය කොටස්

පළමු කොටසේ ඇති නිෂ්පාදන සහ දෙවන කොටසේ ඇති නිදසුන් නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

(1) A-1/B-2/C-3/D-4

(2) A-2/B-1/C-4/D-3

(3) A-4/B-2/C-1/D-3

(4) A-2/B-3/C-4/D-1

(5) A-3/B-2/C-4/D-1 (......)

The National e-learning Portal for The General Education

(23) අලෙවිකරණයේ දී පාරිභෝගික ප්‍රවර්ධන උපක්‍රමයක් වන 'ප්‍රිමියම' හඳුන්වන්නේ,

(1) භාණ්ඩයක් මිලදී ගැනීමේදී තරගයක් පවත්වා ත්‍යාගයක් පිරිනැමීමයි.

(2) භාණ්ඩයක් මිලදී ගැනීමේදී නොමිලේ හෝ අඩු මිලට තවත් භාණ්ඩයක් සැපයීම.

(3) භාණ්ඩයේ සාම්පලයක් දී ඒ ඔස්සේ භාණ්ඩය මිලදී ගැනීමට පෙළඹුමක් ඇතිකිරීම.

(4) භාණ්ඩයක් මිලදී ගැනීමේදී කූපනයක් දී එම ආයතනය තුළින් ම භාණ්ඩය මිලදී ගැනීමට සැලැස්වීම.

(5) භාණ්ඩය පිළිබඳ ලබා දෙන ප්‍රයෝජන නොලැබුණහොත් මුදල් ආපසු ගෙවීම. (......)

(24) භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට අවසරය ලබාගත යුත්තේ,

(1) මුදල් ඇමතිවරයාගෙනි.
(2) මහබැංකු අධිපතිවරයාගෙනි.
(3) භාණ්ඩාගාර ලේකම්ගෙනි.
(4) ජනාධිපතිවරයාගෙනි.
(5) පාර්ලිමේන්තුවෙනි. (......)

(25) බාහිර සේවක ආකර්ෂණය තුළින් ලබාගත හැකි වාසියක් වන්නේ,

(1) ආයතනයට ලැදියාවක් ඇති අයදුම්කරුවන් පිරිසක් ආකර්ශනය කිරීමේ හැකියාවයි.

(2) නව දැනුමෙන් යාවත්කාලීන වූ සේවක පිරිසක් බඳවා ගැනීමේ හැකියාවයි.

(3) පිරිවැය අඩුවීමයි.

(4) අභ්‍යන්තර සේවක තෘප්තිය ඉහළ යාමයි.

(5) අභ්‍යන්තර සේවක ආරවුල් ඇති නොවීමයි. (......)

(26) ව්‍යාපාරයක පරමාර්ථ සකස් කිරීමේදී සැලකිය යුතු ප්‍රධාන කරුණු පමණක් නිවැරදිව ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ව්‍යාපාරයේ වයස / ළඟාකරගැනීමට උත්සහ කරන දෑ / ළඟාකර ගැනීමේ කාලය / ව්‍යාපාරික නාමය.

(2) ව්‍යාපාර සංවිධාන ක්‍රමය / දක්ෂතා / ළඟාකරගැනීමේ කාලය / සාර්ථකත්වය මනින මිනුම් දඬු.

(3) ව්‍යාපාර හිමිකාරත්වයේ ස්වභාවය / නිෂ්ඨාව / ළඟාකරගැනීමේ ක්‍රම හා ප්‍රතිපත්ති / ළඟාකරගැනීමේ කාලය.

(4) ව්‍යාපාරයේ ඉලක්ක / දක්ෂතා / වෙළඳපොළ / සේවකයින්ගේ ස්වභාවය.

(5) ව්‍යාපාරයේ ස්වභාවය / ව්‍යාපාරය ළඟාකරගැනීමට උත්සහ දරන දෑ / අපේක්ෂා ළඟා කරගන්නා ආකාරය / ළඟාකර ගැනීමේ කාලය.

(......)

(27) අභ්‍යන්තර මූල්‍ය සම්පාදන මාර්ගයක් වන්නේ,

(1) කල්බදුය.
(2) සාමාන්‍ය කොටස් නිකුත් කිරීමය.
(3) ණය සාධ්‍යකරණය.
(4) වත්කම් විකිණීමය.
(5) වරණීය කොටස් නිකුත් කිරීමය. (......)

(28) සංවිධානයක මුදුන් මට්ටමේ කළමනාකරුවන් පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) අධ්‍යක්ෂවරු, මූල්‍ය කළමනාකරුවන්, නිෂ්පාදන කළමනාකරුවන්

(2) අධ්‍යක්ෂවරු, වැඩ මූලික, මූල්‍ය කළමනාකරුවන්

(3) මූල්‍ය කළමනාකරුවන්, නිෂ්පාදන කළමනාකරුවන්, සාමාන්‍යාධිකාරී

(4) ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂවරු, වැඩ මූලික

(5) ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී, අධ්‍යක්ෂවරු (......)

(29) භාණ්ඩයක මිල තීරණය කිරීමේදී සැලකිය යුතු මූලික සාධකය වන්නේ,

(1) පාරිභෝගික ආදායම (2) තරගකාරී භාණ්ඩවල මිල
(3) නිෂ්පාදිතයේ පිරිවැය (4) ආදේශක භාණ්ඩවල මිල
(5) ඉල්ලුම් නම්‍යතාවය (......)

(30) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වන ලංකා බැංකුවේ තැම්පත් භාරගැනීම, මුදල් ගෙවීම, උකස් කටයුතු, චෙක්පත් නිශ්කාශනය, ණය නිකුත් කිරීම් ලෙස ඇති කාර්ය සමූහයකි. මේවා ඉටු කිරීමට වෙන වෙනම තනතුරු ඇතිකිරීම හඳුන්වනුයේ,

(1) රැකියා විශ්ලේෂණය ලෙසය. (2) රැකියා පිරිවිතරය ලෙසය.
(3) රැකියා නිර්මාණය ලෙසය. (4) කාර්යඵල ඇගයීම් ලෙසය.
(5) රැකියා විස්තරය ලෙසය. (......)

- **ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉරි මත ලියන්න.**

(31) (අ) ගණුදෙනුකරුවන් හමුවේ ආයතනයක් විසින් ඉටුකිරීමට අපේක්ෂිත වගකීම් හා චර්යාවන් සමුදායක් ඇතුළත් කොට සකස්කර ඇති මාර්ගෝපදේශයක් .... ලෙස හැඳින්වේ.

(ආ) වෙළඳපොල තුළ සිදුවිය හැකි අක්‍රමිකතා, විනිමය වංචා, කොටස් වෙළඳපොල තුළ සිදුවිය හැකි වංචා යනාදී විෂමාචාර පිටු දැකීම .... ක්ෂේත්‍රයට අයත් ආචාර ධර්මතා වේ.

(32) (අ) සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් වන ආකාරයට කොටස් හිමියන්ගේ පෞද්ගලික දේපලවලට බලපෑමක් වන සමාගම් .... නමින් හැඳින්වේ.

(ආ) ව්‍යාපාරයක බාහිර පරිසරය සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් .... වේ.

(33) (අ) මිහිකත සමුළුව යන කෙටි නාමයෙන් හඳුන්වනු ලබන ජාත්‍යන්තර සංවිධානය කුමක් ද?

....

(ආ) ලෝකයේ ආර්ථිකයන් අන්තර් රැඳියාවකින් යුත් තනි ආර්ථිකයක් ලෙස කටයුතු කිරීමේ ප්‍රවණතාව හඳුන්වන්නේ .... ලෙසය.

(34) (අ) මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහබැංකුව විසින් භාවිතා කරනු ලබන පොළී අනුපාතය .... වේ.

(ආ) වාණිජ බැංකු විසින් ගණුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණ උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් (ATM) සවිකිරීමේදී අවසර ලබාගත යුත්තේ .... මගිනි.

(35) (අ) ආකර්ශනීයබව, ... හා .... අවස්ථාවකට ආවේණික ලක්ෂණය.

(ආ) නිශ්චිත ස්ථානයක සිට විකුණුම් කරුවන් හා ගැණුම්කරුවන් මුණගස්වා සේවා විකිණීමට අවකාශය සලස්වන නියෝජිතයා .... වේ.

(36) (අ) විභව බැංකු කරුවන්ට හෝ ඇල්මක් දක්වන පාර්ශවයන්ට ඔබගේ ව්‍යාපාරය පිළිබඳ පොරොන්දු හා විශ්මිතයන් අලෙවිකරණ ලියවිල්ල .... වේ.

(ආ) නිෂ්පාදන ක්‍රියා පටිපාටි, අවශ්‍ය දැනුම හා උපකරණ, කර්මාන්තශාලා ස්ථානගත කිරීම්, අපේක්ෂිත නිෂ්පාදිත වට්ටම්, ගුණත්වය ආරක්ෂණ විධි ඇතුලත්ව නිෂ්පාදිත වර්ධනය කරගන්නා අයුරු ඇතුළත්

(37) (අ) ශ්‍රී ලංකාවේ ඇඟලුම් මිලදී ගන්නා ප්‍රධාන රටවල් දෙක අනුපිළිවෙලින් වන්නේ .... හා .... යයි.

(ආ) පහත දැක්වෙන්නේ කිසියම් වර්ෂයකට අදාළ ආනයන හා අපනයන පිළිබඳ තොරතුරු කිහිපයකි.

භාණ්ඩ අපනයනය රුපියල් බිලියන	1000
සේවා අපනයනය රුපියල් බිලියන	900
භාණ්ඩ ආනයනය රුපියල් බිලියන	2200
සේවා ආනයනය රුපියල් බිලියන	800

මෙම වර්ෂයට අදාළ වෙළඳශේෂය වන්නේ .... කි.

(38) (අ) වෙනසක් නොකරම බැරි අවස්ථාවකදී නව්‍යතා සම්පාදනයට යොමුවන ව්‍යවසායකයා .... ලෙස හඳුන්වයි.

(ආ) ''පීටර් ඩ්‍රකර්ටගේ'' අදහසට අනුව ව්‍යවසායකයකු .... නිර්මාණශීලීත්වය (Creativeness) ලෙස හඳුන්වයි.

(39) (අ) නිර්මාණශීලී ක්‍රියාවලිය තුළ අන්තර්ගත සාධක පහත දැක්වෙන සටහනේ හිස් කොටු යොදාගනිමින් සම්පූර්ණ කරන්න.



(ආ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා රාජ්‍ය හිමිකාරීත්වය යටතේ පිහිටුවා ඇති බැංකුව වන්නේ .... බැංකුවයි.

(40) (අ) ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන තීරණ දෙක (1) .... හා (2) .... වේ.

(ආ) මූල්‍ය කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ .... කිරීමයි.

- **ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(41) (අ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඉටුකරන කාර්යයන් දෙකක් දක්වන්න.

(1) ....

(2) ....

The National e-learning Portal for The General Education

(ආ) වරලත් ව්‍යාපාර වර්ග දෙකක් නම් කරන්න.

(1) ....

(2) ....

(42) වෙළඳ ලකුණ හා සන්නම් අතර වෙනස්කම් දක්වන්න.

(1) ....

(2) ....

(43) විකුණුම් නියෝජිතයෙකු සතු ගුණාංග මොනවා ද?

(1) ....

(2) ....

(3) ....

(4) ....

(44) පාරිභෝගික අයිතිවාසිකම් හතරක් ලියන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(45) (අ) වෙළඳ කටයුතු වලදී භාවිතා කරන කිරුම් මිනුම් උපකරණ මාස 12 කට වරක් හරි වැරදි බලා රජයේ මුද්‍රාව තබා ගත යුතු බව දක්වා ඇත්තේ කුමන පනතේ ද?

....

(ආ) පසුගිය වසරේ ජාතික තත්ත්ව සම්මානය දිනූ ආයතනය වන්නේ .... ය.

(46) 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වයක් ලැබෙන ආංශික සංයුතිය දක්වන්න.

(1) ....

(2) ....

(3) ....

(47) (අ) රැකියා ගිවිසුම යනු කුමක් ද? ....

(ආ) කුසලතා ලේඛනය / තොරතුරු ලේඛනය යනු කුමක් ද? ....

....

....

e-තක්සලාව The National e-learning Portal for The General Education

(48) (අ) පාරිභෝගික දෘෂ්ටියෙන් නිෂ්පාදිතයක වටිනාකම (Value) මැනීම සඳහා භාවිතා කළ හැකි සමීකරණයක් පහත දැක්වේ. එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.

වටිනාකම = ――――― / පිරිවැය

(ආ) පසුගියදා ආනයනය කරනු ලැබූ අල, ළූණු වැනි වෙළඳ භාණ්ඩ සඳහා ඉහළ දමනු ලැබූ බද්ද කුමන නමකින් හඳුන්වයි ද? ....

(49) භාණ්ඩ ඇසුරුම් කරණයේ දී භාවිතා වන පහත සඳහන් ප්‍රමිතිකරණය කරන ලද සංකේතවලින් ප්‍රකාශ වන අර්ථය සඳහන් කරන්න.






....

(50) (අ) ඡායාගත පිළිබිඹු චෙක්පතක (Image Cheque) සම්මත පරිමානය දක්වන්න. ....

(ආ) ලාභය හෝ ධනය ඉපයීම අරමුණු කර නොගෙන සාමාජීයය වටිනාකම් හා සාරධර්ම පෝෂණය කිරීමේ අරමුණින් නව්‍යතා සම්පාදනය හඳුන්වන්නේ කුමන නමකින් ද? ....

(2 x 50 = 100)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ව්‍යාපාර අධ්‍යයනය - II

13 ශ්‍රේණිය | **කාලය පැය 03 යි.**

උපදෙස් :-

- **පළමුවන ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීමේදී අළුත් කඩදාසියකින් ආරම්භ කරන්න.**
- **අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.**

I කොටස

(01) (i) (අ) ''අරමුණු ඉටුකරගැනීම සඳහා ව්‍යාපාර විවිධ කාර්යයන්හි නියැලේ.'' එවැනි කාර්යයන් හයක් නම් කරන්න.

(ආ) ''රටක සෑම අංශයකම තීරණාත්මක බලවේගය ව්‍යාපාරයි.'' මෙම ප්‍රකාශයේ අන්තර්ගතය පිළිබඳ විමසීමක් කරන්න. (ල.04)

(ii) ශ්‍රී ලංකාව තුළ වේගයෙන් ආරම්භවන හා වේගයෙන් වැසීයන ව්‍යාපාර ගණයට කේවල ස්වාමි ව්‍යාපාර අයත් වේ.'' (ල.04)

(iii) (අ) ව්‍යාපාර ආචාරධර්ම අතර ප්‍රධාන ආචාර ධර්ම ත්‍රිත්වයක් දැක්වෙන 3R සංකල්පයේ විචල්‍යයන් නම් කරන්න.

(ආ) ගිණිකෙලි භාණ්ඩ නිෂ්පාදකයකු පිරිවැය අවම කිරීමේ අරමුණින් බාල වයස්කාර ළමයින් සහ නුපුහුණු කම්කරුවන් සේවයට යොදාගෙන ඇත. පවත්නා නීති හා ආචාරධර්ම අනුව මෙහි ආදීනව පැහැදිලි කරන්න. (ල.04)

(iv) ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යුහය සලකා බැලූ විට වැඩිහිටි ජනගහනය හා කාන්තා නියෝජනය ඉහළ ගොස් ඇත. මෙම ප්‍රවනතාවය නිසා ඇති වී තිබෙන ව්‍යාපාරික අවස්ථා 02 ක බැගින් සඳහන් කරන්න. (ල.04)

(v) සාර්ව පරිසර බලවේගයක් වන ගෝලීය පරිසරය දේශීය ව්‍යාපාර කෙරෙහි සිදුකරන හිතකර බලපෑම් සහ අහිතකර බලපෑම් විස්තර කරන්න. (ල.04)

(02) (i) (අ) ව්‍යාපාර සමාජ වගකීම් යන පුළුල් දර්ශනය තුළ සාකච්ඡා කරන ප්‍රධාන පාර්ශව හතර නම් කරන්න.

(ආ) ශ්‍රී ලංකාවේ ඇතැම් ව්‍යාපාරිකයින් විසින් සිදුකරනු ලබන වෙළෙඳ විෂමචාර හතරක් සඳහන් කර එම විෂමාචාර වැළැක්වීම සඳහා රජයට ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.

(ii) ව්‍යාපාරයකට ආර්ථික සංවර්ධනයට දායක විය හැකි ආකාර හතරක් විස්තර කරන්න.

(iii) (අ) හවුල් ව්‍යවස්ථාවලියක් සාංගමික ව්‍යවස්ථාවලියෙන් වෙනස් කෙරෙන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ආ) මහා පරිමාණ ව්‍යාපාර බොහොමයක් වර්තමානයේ සීමිත පොදු සමාගම් ලෙස කරගෙන යන බව පෙනේ. ඊට හේතුවන සාධක කවරේ ද?

(iv) සීමිත පොදු සමාගමක කොටස් මහජන නිකුතුවකට අදාළව, සිදුවන සංස්ථා ප්‍රකාශය හා ප්‍රතිරක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(v) ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති මූලික වශයෙන් පාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි. මුදල් සැපයුම වෙනස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාවිතා කරන මූලික උපකරණ හතරක් පහත දැක්වේ. මෙම උපකරණ මුදල් සැපයුම කෙරෙහි බලපාන ආකාරය ඔබේ පිළිතුරු පතෙහි දක්වන්න.

මුදල් සැපයුම වැඩිකිරීම	උපකරණ	මුදල් සැපයුම අඩු කිරීම
....	සංචිත අවශ්‍යතා	....
....	වට්ටම් අනුපාත	....
....	විවෘත වෙළඳපොල කටයුතු	....
....	තෝරාගත් ණය පාලන	....

(03) (i) (අ) ව්‍යවසායකයෙකු තුළ සාමාන්‍ය ව්‍යාපාරිකයකුට වඩා ඔබ දකින වෙනස්කම් කවරේ ද?

(ආ) ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ මට්ටම් තුනක් යටතේ විශ්ලේෂණය කළහැකිය. එම මට්ටම් තුන දක්වා නිදසුන් සපයන්න.

(ii) (අ) මෑතකදී සංවර්ධන ලොතරැයියකින් රුපියල් මිලියනයක් දිනුම් ලද සිරිපාල එම මුදල ආයෝජනය කිරීමට අදහස් කරන්නේ මූල්‍ය සමාගමක ස්ථාවර තැම්පතුවකය. සුදුසු මූල්‍ය සමාගමක් තෝරා ගැනීමට ඔබ ඔහුට දෙන උපදෙස් කවරේ ද?

(ආ) චෙක්පතක් රේඛනය කිරීමෙන් අණකරු අපේක්ෂා කරන්නේ කුමක් ද? චෙක්පතක් පිටසන් කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(iii) ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර දිරිමත් කළයුත්තේ මන්ද?

එම ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට දැනට ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම මොනවා ද?

(iv) (අ) වාණිජ බැංකු විසින් ව්‍යාපාර සඳහා විවිධාකාරයේ සේවා සපයනු ලැබේ. එවැනි සේවා හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් වශයෙන් වරලත් ව්‍යාපාර ශ්‍රී ලාංකීය සමාජය තුළ ව්‍යාප්ත වීම කෙරෙහි බලපා ඇති හේතු මොනවා ද?

(v) (අ) හොඳ මුදලක පවතින ගුණාංග මොනවා ද?

(ආ) පහත දැක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.

(1) ව්‍යවහාර මුදල් (නියෝග මුදල්)

(2) බැංකු මුදල්

(04) (i) (අ) ණය පතකින් ගණුදෙනු කිරීමේදී ඊට සම්බන්ධ පාර්ශව දක්වන්න.

(ආ) ණයපත් භාවිතය මෑත වර්ෂ කිහිපය තුළ ඉතා සීඝ්‍ර ලෙස සිදු වී ඇත. ණයපත් භාවිතය මගින් ගනුදෙනු කරුවන්ට හා අදාළ මූල්‍ය ආයතනවලට ඇතිවන වාසි දෙක බැගින් දක්වන්න.

(ii) (අ) රක්ෂණය තුළ දී ඔබට හමුවන ''අවදානම'', ''උපද්‍රවය'', ''උපද්‍රවශීලීත්වය හා අලාභය'' යන පදවල අර්ථ ඔබ පැහැදිලි කරන්නේ කෙසේද?

(ආ) ජීවිත රක්ෂණ වන්දියක් ලබාගැනීමට යාමේදී රක්ෂිතයාට මුහුණ දීමට සිදුවන ගැටලු දෙකක් ලියන්න.

(iii) (අ) සඵලදායී සන්නිවේදනය යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(ආ) සඵලදායී සන්නිවේදන ක්‍රමයෙහි ගුණාංග දක්වන්න.

(iv) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ඉදිවී ඇති හා ඉදිවෙමින් පවතින අධිවේගී මාර්ග නම් කර ඒ තුළින් ප්‍රවාහනයේ කාර්යක්ෂමතාව වර්ධනය වන ආකාරය දක්වන්න.

(v) වර්තමාන ශ්‍රී ලංකාවේ සිල්ලර වෙළඳාමේ හැරවුම් ලක්ෂ්‍ය ලෙස විද්‍යුත් සිල්ලර වෙළඳාම ප්‍රධාන තැනක් ගනී.

(1) විද්‍යුත් සිල්ලර වෙළඳාම යනු කුමක් ද?

(2) මෙයින් පාරිභෝගිකයාට අත්වන වාසි 03 ක් ලියන්න.

II කොටස

(05) (i) කළමනාකරණයේ දී අපට හමුවන තීරණය යනු කුමක්දැයි හඳුන්වා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවර දක්වන්න.

(ii) ''සම්පත් වල හිඟතාව නිසා පමණක් නොව වෙනත් අභියෝග ගණනාවක්ම හේතුකොට ගෙන කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම වැඩිවෙමින් පවතී.'' පැහැදිලි කරන්න.

(iii) කාර්යක්ෂමතාවය, සඵලදායකත්වය හා ඵලදායකත්වය යන සංකල්ප වෙන වෙනම පැහැදිලි කරන්න.

(iv) කාර්යක්ෂම හා සඵලදායක කළමනාකරුවෙකු වීමට පුද්ගලයකු තුළ කවර සුදුසුකම් තිබිය යුතු දැයි ඔබ සිතන්නේ ද? පැහැදිලි කරන්න.

(v) හිමිකාරත්ව මූල්‍යායනය (Equity financing), ණය මූල්‍යායනය (Debt financing) සහ දෙමුහුන් මූල්‍යායනය (Hibrid financing) කෙටියෙන් වෙන් වෙන්ව හඳුන්වන්න.

(06) (i) පුහුණුව සංවර්ධනයෙන් වෙනස්වන ආකාර හතරක් දක්වන්න.

(ii) නිෂ්පාදන ආයතනයකට, පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලින් අත්වන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න.

(iii) ව්‍යාපාරයක A නමැති ද්‍රව්‍ය අයිතමට සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

වාර්ෂික ද්‍රව්‍ය පරිභෝජනය ඒකක 12000 ඒකකයක පිරිවැය රු. 100

එක් ඇණවුමක් කිරීම සඳහා යන පිරිවැය රු. 300.

තොග රඳවා ගැනීමේ වාර්ෂික පිරිවැය ඒකකයකට රු. 5.

ඉහත තොරතුරු ආශ්‍රයෙන් ද්‍රව්‍ය සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) ගණනය කරන්න.

(iv) මානව සම්පත් කළමනාකරණයේ ප්‍රධාන ඉලක්ක දක්වා කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) (අ) යම් කර්මාන්ත ශාලාවක ''නිෂ්පාදන ධාරිතාව'' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) නිෂ්පාදන ආයතනයක් ස්ථානගත කිරීමේදී කුමන සාධක පිළිබඳව අවධානය යොමුකළ යුතුද?

(07) (i) (අ) ගණුදෙනුකරුවන් ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලබාගැනීම සඳහා තත්ත්ව පාලනය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ආ) තත්ත්ව පාලනය ආයතනයක ලාභදායිත්වය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ii) මිල කිරීමේ ප්‍රතිපත්ති හා මිල කිරීමේ පරමාර්ථ සඳහන් කරන්න.

(iii) ප්‍රවර්ධන ක්‍රමයක් ලෙස ඉසව් හා අත්දැකීම් සංවිධානය කිරීමේ ප්‍රතිලාභ මොනවා ද?

(iv) රැකියා පිරිවිතරය හා රැකියා විශ්ලේෂණය අතර වෙනස පැහැදිලි කරන්න.

(v) කාර්යඵල ඇගයීමේ ප්‍රධාන අරමුණු 02 ක් දක්වන්න.

(08) (i) (අ) සැලසුම්කරණය යන්න හඳුන්වා එහි ප්‍රධාන පියවර දක්වන්න.

(ආ) ''සංවිධානයක සාර්ථකත්වය කෙරෙහි බලපාන ප්‍රබල සාධකයකි නායකත්වය.'' පැහැදිලි කරන්න.

(ii) ''සෑම කළමනාකරුවෙක්ම මානව සම්පත් කළමනාකරුවෙකි.'' ඔබගේ අදහස් දක්වන්න.

(iii) මූල්‍ය හා භෞතික සම්පත් සමඟ සසඳන කළ මානව සම්පත තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ කවරේදැයි විස්තර කරන්න.

(iv) ''ආයතනයක සේවකයන් අභිප්‍රේරණය කිරීමේ එකම ක්‍රමය මුදල් නොවේ.'' සේවකයන් අභිප්‍රේරණය කළහැකි වෙනත් ක්‍රම මොනවා ද?

(v) නූතන අලෙවිකරණයේ දී පාරිභෝගිකයාට වැදගත් ස්ථානයක් හිමිවන්නේ මක් නිසාද? පැහැදිලි කරන්න.

The National e-learning Portal for The General Education